# "සහසක් නිමැවුම් - 2024" ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය සහ තරඟය සඳහා වන පළාත් මට්ටමේ පූර්ව දැනුවත් කිරීම හා නව නිපැයුම් තෝරාගැනීම

## <u>කොන්දේසි සහ අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ</u>

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් "සහසක් නිමැවුම් - 2024" ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය හා තරඟය සඳහා නව නිපැයුම්කරුවන් තෝරාගැනීම පළාත් මට්ටමින් සිදුකරනු ලබයි. මෙම වැඩසටහන් ද්විත්වයම නොමිලයේ කොමිසම මඟින් පවත්වනු ලබයි.

**<u>පළාත් මට්ටමේ පූර්ව දැනුවත් කිරීමේ හා නව නිපැයුම් තෝරාගැනීමේ කාලසටහන</u>**

| පළාත | පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන | | මූලික තෝරාගැනීමේ වැඩසටහන | | අයදුම්පත් කොමිසම වෙත යොමු කළ යුතු අවසන් දිනය |
|---|---|---|---|---|---|
| | දිනය | ස්ථානය | දිනය | ස්ථානය | |
| සබරගමුව | 2024 මාර්තු 12 | සීවලී මධ්‍ය විද්‍යාලය, හිඳැල්ලන, රත්නපුර | 2024 ජූලි 11 | සීවලී මධ්‍ය විද්‍යාලය, හිඳැල්ලන, රත්නපුර | 2024 ජූලි 04 |
| දකුණ - හම්බන්තොට | 2024 මාර්තු 18 | ශ්‍රවණාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට | 2024 අගෝස්තු 07 | ශ්‍රවණාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට | 2024 අගෝස්තු 01 |
| දකුණ - මාතර | 2024 මාර්තු 19 | පරිගණක විද්‍යා අංශය, විද්‍යා පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර | 2024 අගෝස්තු 08 | විද්‍යා පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර | |
| දකුණ - ගාල්ල | 2024 මාර්තු 20 | සවුත්ලන්ඩ්ස් විද්‍යාලය, ගාල්ල | 2024 අගෝස්තු 09 | සවුත්ලන්ඩ්ස් විද්‍යාලය, ගාල්ල | |
| වයඹ | 2024 මාර්තු 23 | ශ්‍රීමත් ජෝන් කොතලාවල විද්‍යාලය, දඹුල්ල පාර, කුරුණෑගල | 2024 ජූලි 16 | ශ්‍රීමත් ජෝන් කොතලාවල විද්‍යාලය, දඹුල්ල පාර, කුරුණෑගල | 2024 ජූලි 09 |
| නැගෙනහිර | 2024 මාර්තු 27 | ප්‍රධාන ශ්‍රවණාගාරය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, වන්තරුමූලෙයි, චෙන්කලඩි | 2024 ජූලි 25 | ප්‍රධාන ශ්‍රවණාගාරය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, වන්තරුමූලෙයි, චෙන්කලඩි | 2024 ජූලි 19 |
| | 2024 මාර්තු 28 | කාර්මික විද්‍යාලය, මිහිඳුපුර, ත්‍රිකුණාමලය | | | |
| උතුර | 2024 මාර්තු 30 | කලා පීඨය, යාපනය විශ්වවිද්‍යාලය, රාමනාදන් පාර, යාපනය | 2024 ජූලි 27 | පුස්තකාල ශ්‍රවණාගාරය, යාපනය විශ්වවිද්‍යාලය, රාමනාදන් පාර, යාපනය | |
| මධ්‍යම | 2024 අප්‍රේල් 03 | ධර්මරාජ විද්‍යාලය, මහනුවර | 2024 අගෝස්තු 13 | ධර්මරාජ විද්‍යාලය, මහනුවර | 2024 අගෝස්තු 06 |
| | 2024 අප්‍රේල් 04 | ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය, නුවරඑළිය | | | |
| ඌව | 2024 අප්‍රේල් 05 | ප්‍රධාන දේශණ ශාලාව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල | 2024 අගෝස්තු 03 | ප්‍රධාන දේශණ ශාලාව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල | 2024 ජූලි 26 |
| උතුරු මැද | 2024 අප්‍රේල් 25 | රාජකීය මධ්‍ය මහා විද්‍යාලය, පොළොන්නරුව | 2024 අගෝස්තු 21 | උසස් තාක්ෂණ ආයතනය, නව පුත්තලම් පාර, පණ්ඩුලගම, අනුරාධපුර | 2024 අගෝස්තු 14 |
| | 2024 අප්‍රේල් 26 | උසස් තාක්ෂණ ආයතනය, නව පුත්තලම් පාර, පණ්ඩුලගම, අනුරාධපුර | | | |
| බස්නාහිර - කළුතර | 2024 අප්‍රේල් 29 | ඥානෝදය විද්‍යාලය, කළුතර | 2024 අගෝස්තු 27 | ඥානෝදය විද්‍යාලය, කළුතර | 2024 අගෝස්තු 20 |
| බස්නාහිර - ගම්පහ | 2024 අප්‍රේල් 30 | ශ්‍රවණාගාරය, අග්‍රා ගොඩනැගිල්ල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | 2024 අගෝස්තු 28 | ශ්‍රවණාගාරය, අග්‍රා ගොඩනැගිල්ල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | |
| බස්නාහිර - කොළඹ | - | - | 2024 අගෝස්තු 29 | ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය, ඕල්කට් මාවත, මරදාන | |

**<u>පළාත් මට්ටමේ පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ලියාපදිංචිය</u>**

පළාත් මට්ටමේ පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා <u>ලියාපදිංචිය මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පමණක් සිදුකළ හැකිය</u>. ඉඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන පිරිස සඳහා පමණක් අවස්ථාව සැලසෙනු ඇත. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ලියාපදිංචි සාර්ථකව වීමෙන් අනතුරුව

ඔබගේ ලියාපදිංචිය තහවුරු කරමින් තහවුරු විද්‍යුත් ලිපියක් ඔබගේ විද්‍යුත් තැපැල වෙත ලැබෙනු ඇත. එහිදී සහභාගී වීමට අපේක්ෂා කරන පළාත් දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා ***"වෙනත් වැඩසටහනක් සඳහා උත්සාහ කරන්න. අදාල වැඩසටහන සඳහා වන උපරිම ප්‍රමාණයට ලියාපදිංචිය සිදුව අවසන්ය"*** ලෙස සඳහන්ව ඇත්නම් ඉඩ සීමිත හෙයින් ඔබගේ ලියාපදිංචිය අනුමත වී නොමැති බව එමඟින් දැනුම් දෙනු ලබයි.

පළාත් මට්ටමේ පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ලියාපදිංචිය සඳහා පහත සබැඳියන් තුලින් යොමුවන්න.

| | |
|---|---|
| පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ලියාපදිංචි වීමට කොමිසමේ වෙබ් අඩවියට පහත පරිදි පිවිසීම මඟින් සිදුකල හැකිය.<br>**https://slic.gov.lk/**<br>↓<br>**Events**<br>↓<br>**Provincial Programmes 2024**<br>↓<br>**Provincial Awareness** | මෙය QR කේතය පරිලෝකනය කිරීම මඟින් ද හැකිය<br><br>මෙම සබැඳිය තුලින් යොමුවීම මඟින් ද සිදුකල හැකිය.<br>**https://forms.gle/cQBqzC5fZDFowyci6** |

## <u>පළාත් මට්ටමේ නව නිපැයුම් තෝරාගැනීමේ වැඩසටහන් සඳහා ලියාපදිංචිය</u>

පළාත් මට්ටමේ පූර්ව නව නිපැයුම් තෝරාගැනීමේ වැඩසටහන් සඳහා ලියාපදිංචිය <u>මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මෙන්ම</u> කොමිසම මඟින් පළකර ඇති <u>අයදුම්පත්‍රය සම්පූර්ණ කර එවීම මඟින්</u> ද සිදුකල හැකිය. එම අයදුම්පත්‍රය කොමිසමේ වෙබ් අඩවියේ "භාගත කිරීම්" (Downloads) හි පළාත් නව නිපැයුම් ඇගයීම් (Provincial Inventions Evaluation) වෙත පිවිසීම මඟින් හෝ ***https://shorturl.at/kBKV1*** යන සබැඳිය ඔස්සේ පිවිසීම මඟින් භාගත කරගත හැක.

එසේ වුව ද පළාත් මට්ටමේ නව නිපැයුම් තෝරාගැනීමේ වැඩසටහන් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම් කරන නව නිපැයුම්කරුවන් හට ප්‍රමුඛත්ව අනු අංක, පද්ධතිය මඟින් ස්වයංක්‍රියව ලබාදෙනු ලබන අතර අනෙකුත් අයදුම්කරුවන් සඳහා ඉන් අනතුරුව පද්ධතිය මඟින් අනු අංක නිකුත් කිරීම සිදුවේ.

පළාත් මට්ටමේ නව නිපැයුම් තෝරාගැනීමේ වැඩසටහන් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ලියාපදිංචිය වෙනුවෙන් පහත සබැඳියන් තුලින් යොමුවන්න.

| | |
|---|---|
| පළාත් මට්ටමේ නව නිපැයුම් තෝරාගැනීමේ වැඩසටහන් සඳහා ලියාපදිංචි වීමට කොමිසමේ වෙබ් අඩවියට පහත පරිදි පිවිසීම මඟින් සිදුකල හැකිය.<br>**https://slic.gov.lk/**<br>↓<br>**Events**<br>↓<br>**Provincial Programmes 2024**<br>↓<br>**Provincial Evaluations** | තව ද මෙම QR කේතය පරිලෝකනය කිරීම මඟින් ද හැකිය.<br><br>එමෙන්ම මෙම සබැඳිය තුලින් යොමුවීම මඟින් ද සිදුකල හැකිය.<br>**https://forms.gle/kmJsLY5wgM46ENg36** |

## <u>පළාත් තරඟය සඳහා ඉදිරිපත් විය හැකි අංශයන්</u>

පහත සඳහන් අංශයන්ගෙන් <u>එක් අංශයකින්</u> ඔබට තරඟය සඳහා ඉදිරිපත් විය හැකිය.

1. පාසල් අංශය 2. විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන අංශය 3. වාණිජකරණය වූ නව නිපැයුම් අංශය
4. විවෘත අංශය 5. ආයතනික අංශය

***<u>පාසල් අංශය</u>***

- <u>පාසල් අංශය</u> සඳහා වූ අයදුම්කරුවන්ගේ <u>උපරිම වයස් සීමාව</u> වනුයේ <u>දෙවන වර අ.පො.ස. උසස් පෙළ</u> සඳහා පෙනී සිටින සිසුන්ගේ වයස් සීමාව වේ. එම වයස් සීමාවෙහි වූ පාසල නියෝජනය කරන <u>සිසුන්ට පාසල් අංශය හැර වෙනත් අංශයකින් ඉදිරිපත් විය නොහැකිය</u>. ඔවුන් අයදුම්පත් යොමුකරන අවස්ථාවේ දී <u>පාසල් හැරගිය ශිෂ්‍යයන් නොවිය යුතුය.</u> මෙම අයදුම්කරුවන් "<u>සහසක්</u>

නිමැවුම් - 2024" ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය හා තරඟය සඳහා තෝරාගනු ලැබුවහොත්, ඔවුන් අදාල අයදුම්පත් යොමුකරන අවස්ථාවේ දී පාසලක ශිෂ්‍යකු/ ශිෂ්‍යාවක බවට අදාල පාසලේ විදුහල්පති ගේ නිර්දේශය ලබාදීම අනිවාර්යය වේ.

- පාසල් සිසුන්ගේ කණ්ඩායම් නව නිපැයුම් සඳහා සහභාගී විය හැකි උපරිම සිසුන් ගණන 02කි.

- පාසල් සිසුන් කණ්ඩායම් නව නිපැයුම් ඉදිරිපත් කිරීමේදී කණ්ඩායමේ අනිත් සාමාජිකයා ද පාසල් සිසුවෙක් වීම අනිවාර්යය වේ. පාසල් අංශයෙන් ඉදිරිපත් වන නව නිර්මාණ සඳහා පාසල් සිසුන් නොවන නව නිපැයුම්කරුවන් සාමාජිකයින් ලෙස ඉදිරිපත් විය නොහැකිය.

පාසල් සිසුන් ඉහත සඳහන් කර ඇති තම ශිෂ්‍ය භාවය නිසි පරිදි තහවුරු කිරීමට අපොහොසත්ව ඇති අවස්ථාවන්හි දී, ඔවුන්ගේ නව නිපැයුම ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය හා තරඟය සඳහා තෝරාගනු ලැබුවහොත් එම නව නිපැයුම් වෙනත් අදාල අංශයක නව නිපැයුම් සේ සළකා ඇගයීම් කටයුතු සිදුකරනු ලැබේ.

***විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන අංශය***

- විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන අංශය සඳහා ඉදිරිපත් වන විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ශිෂ්‍යයන් අයදුම්පත් යොමුකරන අවස්ථාවේ දී විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයන් වශයෙන් පළමු උපාධිය සම්පූර්ණ කිරීමේ නියැළී සිටිය යුතුය. තෘතියික අධ්‍යාපන ආයතන නියෝජනය කරන ශිෂ්‍යයන් ශිෂ්‍යයන් ද අයදුම්පත් යොමුකරන අවස්ථාවේ දී එම අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යාපන කටයුතු වල නියැළී සිටිය යුතුය.

- මෙම අයදුම්කරුවන් ශිෂ්‍ය හැඳුනුම්පත ඡායාපිටපතක් මූලික තෝරාගැනීමේ දී ඉදිරිපත් කල යුතුය.

- නව නිපැයුම සඳහා සම්බන්ධ වූ විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතනයන්හි ආචාර්යවරුන්ට කණ්ඩායම් සාමාජිකයන් ලෙස ඉදිරිපත් විය හැකිය.

- මෙම සිසුන් සහ ආචාර්යවරුන් යන දෙපිරිස හැර වෙනත් පුද්ගලයින් කණ්ඩායම් සාමාජිකයින් ලෙස සලකා නව නිපැයුම් විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන අංශයෙන් ඉදිරිපත් කල නොහැකිය.

විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතනයන් හි සිසුන් ඉහත දක්වා ඇති පරිදි තම ශිෂ්‍ය භාවය නිසි පරිදි තහවුරු කිරීමට අපොහොසත්ව ඇති අවස්ථාවන්හි දී, එම නව නිපැයුම් "විවෘත අංශයේ" නව නිපැයුම් සේ සළකා ඇගයීම් කටයුතු සිදුකරනු ලැබේ.

***වාණිජකරණය වූ නව නිපැයුම් අංශය***

වාණිජකරණය කරන ලද නව නිපැයුම් අංශයෙන් ඉදිරිපත් වන තරඟකරුවන් තම නව නිපැයුම වාණිජකරණය වී ඇති බවට සහ බුද්ධිමය දේපළ අයිතිය සුරක්ෂිත කරගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති බවට නිසි සාක්ෂි (උදා- නිකුත් කරන ලද පේටන්ට් බලපත්‍රය හෝ පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම් කළ විස්තර, නව්‍යතාවය, පාරිසරික බලපෑම, සුරක්ෂිතතාවය, ව්‍යාපාරයේ පැවැත්ම, අපනයන අවස්ථාවන් සහ දළ වාර්ෂික ආදායම ආදී තොරතුරු තහවුරු කිරීම සඳහා) විනිශ්චය මණ්ඩලයට අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය. එය නව නිපැයුම්කරුගේ වගකීම වේ.

***ආයතනික නව නිපැයුම් අංශය***

- රාජ්‍ය, පෞද්ගලික, පර්යේෂණ සහ වෙනත් අදාළ ආයතන ඇතුළු අදාළ ආයතනවලින් බිහි කරන ලද නව නිපැයුම් සහිත අයදුම්කරුවන් මෙම කාණ්ඩය යටතේ තරඟය සඳහා ඔවුන්ගේ නව නිපැයුම් සහ නවෝත්පාදන ඉදිරිපත් කල යුතුය.
- මෙම කාණ්ඩය යටතේ ඉදිරිපත් විය හැක්කේ වාණිජකරණය නොකළ නව නිපැයුම් පමණි.
- මෙම කාණ්ඩය යටතේ නව නිපැයුම්කරුවෙකු තරඟය සඳහා අයදුම් කරන්නේ නම්, ඔවුන් අදාළ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය, පළාත් නව නිපැයුම් ඇගයීමේ වැඩසටහන් සඳහා ඉදිරිපත් වන අවස්ථාවේ දී විනිශ්චය මණ්ඩලයට අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.
- විශ්වවිද්‍යාල අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් සහ පාසල් සිසුන් මෙම කාණ්ඩය යටතේ තම නව නිපැයුම් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි.

***විවෘත අංශය***

- ඉහත අංශයන්ට අදාළ නොවන සියළුම නව නිපැයුම්කරුවන්ට විවෘත අංශයෙන් පළාත් තරඟය සඳහා ඉදිරිපත් විය හැකිය.

**පළාත් මට්ටමේ නව නිපැයුම් තෝරාගැනීමේ වැඩසටහන් වෙනුවෙන් ලියාපදිංචිය සඳහා වන පොදු උපදෙස්**

කොමිසම මඟින් නිර්වචනය කර ඇති පරිදි අයදුම්කරුවන් අදාළ අංශයන්ගෙන් හැර වෙනත් අංශයකින් අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතු අතර නිවැරදි තරඟ අංශයට ඉදිරිපත් නොවූ අයදුම්පත් කොමිසම විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඔබ විසින් ඉදිරිපත් කරන සෑම නව නිපැයුමකටම එක් අයදුම්පත බැගින් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. එක් අයදුම්පතක නව නිපැයුම් එකකට වැඩි ගණනක් පිළිබඳව සටහන් කිරීම ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වීමට හේතුවක් වේ.

කණ්ඩායම් නව නිපැයුම් ඉදිරිපත් කර ඇති අවස්ථාවලදී අයදුම් පත්‍රයේ පළමුව නම සඳහන් කර ඇති පුද්ගලයා කණ්ඩායමේ නායකත්වය ගනු ලබන පුද්ගලයා ලෙස සලකා බලනු ලබයි. කණ්ඩායමේ සාමාජිකයන් පිළිබඳව **පසුව සිදුකරනු ලබන වෙනස්වීම් කොමිසම විසින් භාරගනු නොලැබේ.**

මීට ඉහත දී කොමිසම විසින් සංවිධානය කරනු ලැබූ සහසක් නිමැවුම් තරඟාවලීන් හි දී ජයග්‍රහණය කරන ලද නව නිපැයුම්, එම අංශයෙන්ම නැවත ඉදිරිපත් කරන්නේ නම් සාධනීය වැඩි දියුණු කිරීමකින් තොරව මෙම වර්ෂයේ පළාත් නව නිපැයුම් තරඟ සඳහා ඉදිරිපත් කළ නොහැක.

නව නිපැයුම තරඟ විනිශ්චයන් සඳහා භෞතිකව ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවන්හිදී පමණක් නව නිපැයුම හා එහි ක්‍රියාකාරීත්වය පැහැදිලි කිරීම උදෙසා ඉදිරිපත් කළ හැකි තරමේ ප්‍රමාණවත් තොරතුරු විනිශ්චය මණ්ඩලය වෙත අයදුම්කරුවන් විසින් සැපයීමට වගබලා ගත යුතු ය.

**මෙම මාර්ගෝපදේශයෙහි ඇතුලත් උපදෙස් පරිදි සම්පූර්ණ <u>නොකළ</u> අයදුම්පත් කොමිසම විසින් <u>ප්‍රතික්ෂේප</u> කරනු ලැබේ.**

සම්පූර්ණ කරන ලද අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට ප්‍රථම යොමු කළ යුතු ය. එය අයදුම්කරුවන් සතු වගකීමක් වන අතර නියමිත දිනට පසුව අයදුම්පත් භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම මාර්ගගත පද්ධතිය මගින් ස්වයංක්‍රියවම සිදුකරන අතර එමගින් සිදුවන අපහසුතා සඳහා කොමිසම විසින් වගකියනු නොලැබේ. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ලියාපදිංචි සාර්ථකව වීමෙන් අනතුරුව ඔබගේ ලියාපදිංචිය තහවුරු කරමින් තහවුරු විද්‍යුත් ලිපියක් ඔබගේ විද්‍යුත් තැපෑල වෙත ලැබෙනු ඇත.

තවද කොමිසම මඟින් කොමිසම මඟින් පළකර ඇති <u>අයදුම්පත්‍රයක්</u> සම්පූර්ණ කරන ලියාපදිංචි තැපෑල මඟින් යොමුකරන අයදුම්පත් ද **"සහසක් නිමැවුම් පළාත් තරඟය 2024"** යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි සඳහන් කර **<u>අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, පස්වන මහල, "මෙහෙවර පියෙස" ගොඩනැගිල්ල, කොළඹ 05</u>** යන ලිපිනය වෙත ඒ ඒ පළාත් සඳහා අදාල අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට ප්‍රථමව ලැබෙන පරිදි යොමු කළ යුතු ය.

එය අයදුම්කරුවන් සතු වගකීමක් වන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේපවීම පිළිබඳව කොමිසම විසින් වගකියනු නොලැබේ.

තව ද මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ හෝ ලියාපදිංචි තැපෑල මඟින් අයදුම්පත සම්පූර්ණ කර කොමිසම වෙත යොමුකළ පසු අයදුම්පත සඳහා <u>කිසිදු වෙනස් කිරීමක්</u> කොමිසම විසින් <u>භාර ගනු නොලැබේ</u>. තව ද,

- **<u>පළාත් ඇගයීම් පැවැත්වෙන දිනයේ රැගෙන එන නව අයදුම්පත් සලකා බලනු නොලැබේ.</u>**
- **ලියාපදිංචි වූ නව නිපැයුම්කරුවන් කාලසටහනෙහි දක්වා ඇති පරිදි නියමිත දිනයේදී අදාල තෝරාගැනීම් සඳහා සහභාගී විය යුතු වන අතර, <u>කොමිසම විසින් නැවත දැනුවත් කිරීමේ ලිපියක් යොමු නොකරන බව සැලකිය යුතු ය</u>.** යම් හෙයකින් අදාල දිනයන් හි සංශෝධනයන් සිදුවන්නේ නම් පමණක් ඒ පිළිබඳව දැනුම් දීමට කටයුතු සලස්වනු ලැබේ.

**<u>බුද්ධිමය දේපළ අයිතිය</u>**

තරඟය සඳහා ඉදිරිපත් කරනු ලබන නව නිපැයුම් <u>ස්ව නිර්මාණ</u> විය යුතුය. වෙනත් පුද්ගලයෙකු විසින් නිර්මාණය කරන ලද නව නිපැයුමක් ප්‍රති නිර්මාණය කර තරඟයට ඉදිරිපත් නොකළ යුතුය. යම් හෙයකින් එසේ ඉදිරිපත් කර ජයග්‍රහණය කර ඇති අවස්ථාවකදී, එම නව නිපැයුමේ මුල් හිමිකරුගේ බුද්ධිමය දේපළ අයිතිය උල්ලංඝනය වී ඇති බව නිසි සාක්ෂි සහිතව තහවුරු වුවහොත් ප්‍රදානය කරන ලද ත්‍යාග හා සියළුම සහතික ආපසු ලබා ගැනීමට කොමිසම කටයුතු කරන අතර එසේ ආපසු ලබා දීම සඳහා ඔබ ද බැඳී සිටී.

**<u>තරඟ පැවැත්වීම සහ තරඟ විනිශ්චය</u>**

- කොමිසම මඟින් අනුමත <u>විනිශ්චය මණ්ඩලයේ තීරණය, විනිශ්චය සම්බන්ධයෙන් අවසන් තීරණය</u> වේ.
- දැනුවත් කිරීමේ වැඩසටහන් හා නව නිපැයුම් තෝරාගැනීමේ මූලික තරඟ පැවැත්වීමට නියමිත <u>දිනයන් සහ ස්ථාන වෙනස් කිරීම ඇතුළු අනෙකුත් සියලු කරුණු පිළිබඳව තීරණ ගැනීමේ පූර්ණ අයිතිය කොමිසම සතු වේ</u>.

**<u>තරඟය සඳහා ඉදිරිපත් විය හැකි තාක්ෂණික ක්ෂේත්‍ර</u>**

ඔබගේ නව නිපැයුම පහත සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් වඩාත් සුදුසු **<u>එක් ක්ෂේත්‍රයකට</u>** අයත් විය යුතුය.

- මහජන ආරක්ෂාව, සුභසාධනය හා ජාතික ආරක්ෂාව
- රසායන විද්‍යාව
- ආහාර තාක්ෂණය
- වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය
- සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව
- පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්
- භෞතික විද්‍යාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- කෘෂිකර්මය
- ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණ
- බලශක්තිය
- පරිසර සංරක්ෂණය
- ප්‍රවාහන
- ඉංජිනේරු

**වැඩිදුර තොරතුරු සඳහා 011-267 66 50 ඔස්සේ කොමිසම අමතන්න. නැතිනම් <u>info@slic.gov.lk</u> ඔස්සේ විමසන්න.**